# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2423/36 - 2025 පෙබරවාරි මස 15 වැනි සෙනසුරාදා - 2025.02.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

MOD/DEF/HRM/01/AMD/REG

එල්.ඩී.-බී 17/2016

**(359 වන අධිකාරය වූ) ගුවන් හමුදා පනත**

(359 වන අධිකාරය වූ) ගුවන් හමුදා පනතේ 29 වන වගන්තිය සහ 155 වන වගන්තිය යටතේ ආරක්ෂක අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**අනුර කුමාර දිසානායක,**
ආරක්ෂක අමාත්‍ය.

2025 ජනවාරි මස 12 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1989 ජනවාරි මස 07 වැනි දින අංක 539/15 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1987 ශ්‍රී ලංකා ගුවන් හමුදා (කාන්තා අංශය) (නිත්‍ය සහ නිත්‍ය උපසේවා) නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) 20 වන නියෝගයේ (4) වන අනුනියෝගයේ "වයස අවුරුදු හතළිස් පහට එළඹීම හෝ අවුරුදු විස්සක උපරිම කාලසීමාවක් සේවය කිරීම යන මේ දෙකින් කලින් එළඹෙන අවස්ථාවෙහි සේවයෙන් විශ්‍රාම ගත යුතු ය." යන වචන වෙනුවට "වයස අවුරුදු පනස්පහට (55) එළඹීම මත හෝ අවුරුදු විස්සක (20) සේවා කාලයක් සම්පූර්ණ කිරීම මත සේවයෙන් විශ්‍රාම ගත යුතු ය." යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) 21 වන නියෝගයේ "වයස අවුරුදු 50ට එළඹෙන තෙක්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "වයස අවුරුදු හැටට (60) එළඹෙන තෙක්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; *සහ*

(3) 35 වන නියෝගයේ (3) වන අනුනියෝගයේ "එළඹීම හෝ අවුරුදු විස්සක උපරිම කාලසීමාවක් සේවය කිරීම යන මේ දෙකින් කලින් එළඹෙන අවස්ථාවෙහි" යන වචන වෙනුවට "එළඹීම මත හෝ අවුරුදු විසි දෙකක (22) කාලසීමාවක් සේවය කිරීම මත" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

EOG 02 - 0135

1A - G 43752 (2025/02)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*